(1) 0.5 mol $l^{-1}$ (2) 0.05 mol $l^{-1}$ (3) 0.025 mol $l^{-1}$
(4) 0.25 mol $l^{-1}$ (5) නිවැරදි පිළිතුර දී නැත.

20. pH අගය 1 වන HCl ද්‍රාවණයකින් 1.0 *l* සමඟ pH අගය 6 වන HI ද්‍රාවණයකින් 10.0 ml එකට මිශ්‍ර කර ඇත. මෙයින් ලැබෙන ද්‍රාවණයේ pH අගය කොපමණ වේද?
(1) 1 (2) 2 (3) 3 (4) 3.5 (5) 0.9

21. $CO_2$ හි මවුලික පරිමාව නිර්ණය කිරීම සඳහා
(1) $Na_2CO_3$ උපයෝගී කරගත හැකිය.
(2) $NaHCO_3$ උපයෝගී කරගත හැකිය.
(3) $ZnCO_3$ උපයෝගී කරගත හැකිය.
(4) ඉහත සියලුම සංයෝග උපයෝගී කරගත හැකිය.
(5) ඉහත කිසිම සංයෝගයක් උපයෝගී කරගත නොහැකිය.

22. X නමැති කාබනික සංයෝගය ඔක්සිකාරක තත්ත්ව යටතේ ඕසෝන විච්ඡේදනයට භාජනය කළ විට, $C_6H_5COOH$ සහ $C_6H_5COC_2H_5$ යන සංයෝග 1:1 මවුල අනුපාතය ඇතිව ලබා දුනි. X හි ව්‍යුහය




(5) මින් එකක්වත් නොවේ.

23. $(CH_3)_2C(C_6H_5)NH_2$ සහ $C_6H_5(CH_2)_3NH_2$ එකිනෙකින් වෙන් කර හඳුනා ගැනීම සඳහා උපයෝගී කිරීමට වඩාත්ම සුදුසු වන ප්‍රතික්‍රියා ශ්‍රේණිය මින් කුමක් වේද?
(1) (i) $NaNO_2$ / HCl සහ (ii) $HNO_3$
(2) (i) $KNO_2$ / HCl සහ (ii) HCl / $ZnCl_2$
(3) (i) $HNO_3$ / $H_2SO_4$ සහ (ii) $K_2Cr_2O_7$ / $H_3O^+$
(4) (i) $NaNO_2$ / HCl සහ (ii) $HNO_3$ / $H_2SO_4$
(5) (i) $HNO_3$ / $H_2SO_4$ සහ (ii) HCl / $ZnCl_2$

24. බෙන්සීන් 3.90g සම්පූර්ණයෙන් දහනය කිරීම සඳහා 546°C සහ 1.5 atm දී අවශ්‍ය වන ඔක්සිජන් පරිමාව
(1) 1.87 *l* වේ. (2) 2.24 *l* වේ. (3) 11.20 *l* වේ.
(4) 16.81 *l* වේ. (5) 37.82 *l* වේ.

25. විද්‍යුත් රසායනික කෝෂයක වි.ගා.බ. සම්බන්ධයෙන් වන මින් කුමන ප්‍රකාශය සත්‍ය වේද?
(1) උෂ්ණත්වය ඉහළ යන විට වි. ගා. බ. වැඩි වේ.
(2) උෂ්ණත්වය ඉහළ යන විට වි. ගා. බ. අඩු වේ.
(3) උෂ්ණත්වය සමඟ වි. ගා. බ. වෙනස් නොවේ.
(4) කෝෂ ප්‍රතික්‍රියාව දී නොමැති නිසා, වි. ගා. බ. කෙරෙහි උෂ්ණත්වයේ බලපෑම පිළිබඳ ස්ථිර කිසිවක් පැවසිය නොහැකිය.
(5) අර්ධ-කෝෂවල සාන්ද්‍රණය දී නොමැති නිසා, වි.ගා.බ. කෙරෙහි උෂ්ණත්වයේ බලපෑම පිළිබඳ ස්ථිර කිසිවක් පැවසිය නොහැකිය.

26. සාපේක්ෂ පරමාණුක ස්කන්ධ ප්‍රකාශ කිරීමේදී උපයෝගී කර ගන්නා නූතන සම්මතය
(1) ඔක්සිජන්ය (2) $^{16}_{8}O$ ය. (3) $^{1}_{1}H$ ය.
(4) $^{14}_{6}C$ ය. (5) ඉහත එකක්වත් නොවේ.

27. Q නැමති සංයෝගය ජලීය HCl සහ ජලීය NaOH යන දෙකෙහි ම ද්‍රාව්‍ය වන අතර, එය උදාසීන $FeCl_3$ සමඟ වර්ණයක් ගෙන දෙයි. Q ඩයැසෝටීකරණයට භාජනය නොවන අතර, කාබයිල් ඇමයින් ප්‍රතික්‍රියාවට ද පිළිතුරු නොදෙයි. Q හඳුනා ගන්න.




28. R නැමති සංයෝගය ජලයේ අද්‍රාව්‍ය වන අතර, එය සුදු පැහැති වේ. සාන්ද්‍ර $H_2SO_4$ සමඟ R ප්‍රතික්‍රියා කරවූ විට, වර්ණවත් වායුවක් මුක්ත වේ. මෙයින් ලැබෙන ද්‍රාවණය බන්සන් දැල්ලට වර්ණයක් ගෙන දෙයි. R හඳුනා ගන්න.
(1) $BaBr_2$ (2) $BaI_2$ (3) CuBr (4) $Cu(NO_3)_2$ (5) CuCl

29. පොටෑසියම් [illegible] කර [illegible] ගැනීම සඳහා
(1) $CHCl_3$ [illegible]
(2) $CCl_4$ උපයෝගී කරගත හැකිය.
(3) ද්‍රව $NH_3$ උපයෝගී කරගත හැකිය.
(4) $C_6H_6$ උපයෝගී කරගත හැකිය.
(5) ඉහත කිසිවක් උපයෝගී කරගත නොහැකිය.

30. Y නමැති මූලද්‍රව්‍යය $Y^{2-}$ ඇනායනය සාදයි. Y සම්බන්ධයෙන් වන මින් කුමන ප්‍රකාශය සත්‍ය වේද?
(1) තුන්වැනි අයනීකරණ ශක්තිය දෙවැනි අයනීකරණ ශක්තියට වඩා බෙහෙවින් විශාල වේ.
(2) හයවැනි අයනීකරණ ශක්තිය පස්වැනි අයනීකරණ ශක්තියට වඩා බෙහෙවින් විශාල වේ.
(3) Y අන්තරික මූලද්‍රව්‍යයක් විය හැකිය.
(4) $Y(g) + 2e \rightarrow Y^{2-}(g)$ යන ක්‍රියාවලියේදී විශාල ශක්ති ප්‍රමාණයක් මුක්ත වේ.
(5) ඉහත ප්‍රකාශ සියල්ලම සාවද්‍ය වේ.

| 31 සිට 40 දක්වා ප්‍රශ්නවලට උපදෙස් | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| (a), (b) පමණක් නිවැරදියි. | (b), (c) පමණක් නිවැරදියි. | (c), (d) පමණක් නිවැරදියි. | (d), (a) පමණක් නිවැරදියි. | ප්‍රතිචාර එකක් පමණක් හෝ වෙනත් ප්‍රතිචාර සංඛ්‍යාවක් හෝ නිවැරදියි. |

31. මින් කුමන ලවන/ ලවනය ජලීය ද්‍රාවණයේදී රතු ලිට්මස් නිල් පැහැයට හරවයිද?
(a) $(NH_4)_2SO_4$ (b) $CH_3COOK$
(c) NaCN (d) $CH_3COONH_4$

32. මින් කුමන කැටායන/ කැටායනය ආම්ලික මාධ්‍යයේදී $H_2S$ මගින් අවක්ෂේප වෙයිද?
(a) $Bi^{3+}$ (b) $Ni^{2+}$ (c) $Zn^{2+}$ (d) $Pb^{2+}$

33. පරමාණු හා අයන සම්බන්ධයෙන් වන මින් කුමන ප්‍රකාශ / ප්‍රකාශය සත්‍ය වේද?
(a) හැම මූලද්‍රව්‍යවලම පරමාණුක අරයන් එකම විශාලත්ව ගණයට අයත් වේ.
(b) හැම මූලද්‍රව්‍යවලම අයනික අරයන් එකම විශාලත්ව ගණයට අයත් වේ.
(c) එකම මූලද්‍රව්‍යයේ සියලුම පරමාණු සර්වසම වේ.
(d) මූලද්‍රව්‍යයක කැටායනික අරය එහි පරමාණුක අරයට වඩා විශාල වේ.

34. ආවර්තිතා වගුව සම්බන්ධයෙන් වන මින් කුමන ප්‍රකාශ/ ප්‍රකාශය සත්‍ය වේද?
(a) Li සිට F දක්වා ඇති මූලද්‍රව්‍යවල ඉහළම ඔක්සිකරණ අංකය 1 සිට 7 දක්වා ක්‍රමවත්ව වැඩි වේ.
(b) Na සිට Cl දක්වා ඇති මූලද්‍රව්‍යවල ඉහළම ඔක්සිකරණ අංකය 1 සිට 7 දක්වා ක්‍රමවත්ව වැඩි වේ.
(c) Na සිට Cl දක්වා ඇති මූලද්‍රව්‍යවල ඉහළම ඔක්සිකරණ තත්ත්වයෙන් ව්‍යුත්පන්න වන ඔක්සයිඩවල ආම්ලික ස්වභාව ක්‍රමවත්ව වැඩි වේ.
(d) Li සිට F දක්වා ඇති මූලද්‍රව්‍යවල හයිඩ්‍රයිඩවල භාෂ්මික ස්වභාවය ක්‍රමවත්ව අඩු වේ.

35. උත්ප්‍රේරක සම්බන්ධයෙන් වන මින් කුමන ප්‍රකාශ/ ප්‍රකාශය සත්‍ය වේද?
(a) සියලුම උත්ප්‍රේරක මගින් ඉදිරි ප්‍රතික්‍රියාවල සක්‍රියන ශක්ති අඩු කෙරේ.
(b) සලකා බලන ප්‍රතික්‍රියාවට උත්ප්‍රේරක සහභාගී නොවේ.
(c) උත්ප්‍රේරකයක් මගින් රසායනික ප්‍රතික්‍රියාවක එන්තැල්පි විපර්යාසය වෙනස් නොකෙරේ.
(d) උච්ච ලෝහ මගින් සිදු කෙරෙන උත්ප්‍රේරණයේදී අධිශෝෂණය වැදගත් වේ.

36.




(a) මේ සංයෝගය ඔක්සිහරණය කිරීමෙන් හයිඩ්‍රොකාබනයක් ලබා ගත හැකිය.
(b) මේ සංයෝගය ඔක්සිහරණය කිරීමෙන් ද්විතීයික ඇල්කොහොලයක් ලබාගත හැකිය.
(c) මේ සංයෝගය $Br_2$ / $FeBr_3$ සමඟ බෙන්සීන්වලට වඩා පහසුවෙන් ප්‍රතික්‍රියා කරයි.
(d) මේ සංයෝගය $Br_2$ / NaOH සමඟ ප්‍රතික්‍රියා කරයි.

37. ඇමයිනෝ අම්ල සම්බන්ධයෙන් වන මින් කුමන ප්‍රකාශ/ ප්‍රකාශය සත්‍ය වේද?
(a) සියලුම ඇමයිනෝ අම්ල ප්‍රකාශ සක්‍රියක සමාවයවික වශයෙන් පවතී.
(b) ප්‍රෝටීන වලින් ලබාගත හැකි සියලුම ඇමයිනෝ අම්ල ප්‍රකාශ සක්‍රිය වේ.
(c) ඇමයිනෝ අම්ල, ඒවාට අනුරූප කාබොක්සිලික් අම්ලවලට වඩා [illegible]
(d) ඇමයිනෝ අම්ලවලට ස්වාරක්ෂක ක්‍රියාව දැක්විය හැකිය.

www.sinhalalibrary.com
Find more: chemistrysabras.weebly.com
twitter: ChemistrySabras

තුළට නිස්සාරණය කර ගැනීම සඳහා ක්‍රමයක් යෝජනා කරන්න.

සැ. යු.
(1) ටෙට්‍රාක්ලෝරොමෙතේන් සහ බෙන්සීන් එකිනෙක සමඟ මිශ්‍රවන බවද, ද්‍රාවණය රත් කිරීමෙන් හෝ ශීත කිරීමෙන් හෝ ටෙට්‍රා-ක්ලෝරොමෙතේන් සහ බ්‍රෝමීන් එකිනෙකින් වෙන් කර ගත නොහැකි බවද ඔබට දන්වා ඇත.
(2) නිස්සාරිත බ්‍රෝමීන් ටෙට්‍රාක්ලෝරොමෙතේන් වලින් තොර විය යුතුය.

(c) (i) කැල්සියම් ක්ලෝරයිඩ්, ස්ටැනස් ක්ලෝරයිඩ් ($SnCl_2$) සහ සිල්වර් නයිට්‍රේට් යන මේවායේ ජලීය ද්‍රාවණ සහ ලෝහමය ඇලුමිනියම් ඔබට සපයා තිබේ. විද්‍යුත් රසායනික ශ්‍රේණියේ ඉහළ සිට පහළට එන විට, මෙහි සඳහන් වන ලෝහ හමුවන්නේ Ca, Al, Sn සහ Ag යන අනුපිළිවෙලට බව රසායනික ද්‍රව්‍ය වශයෙන් ඉහත සපයා ඇති ද්‍රව්‍ය පමණක් උපයෝගි කර ගනිමින්, ඔබ පරීක්ෂණාත්මකව පෙන්වන්නේ කෙසේදැයි සංක්ෂිප්තව දක්වන්න.
(ii) මැග්නීසියම් ඉලෙක්ට්‍රෝඩයෙන් සහ ලෙඩ් ඉලෙක්ට්‍රෝඩයෙන් සමන්විත වන සම්මත විද්‍යුත් රසායනික කෝෂය සඳහා කෝෂ රූප සටහන ලියන්න.
(iii) ඉහත (c) (ii) හි සඳහන් විද්‍යුත් රසායනික කෝෂයේ ධන ධ්‍රැවයෙහිදී සිදුවන ඉලෙක්ට්‍රෝඩ ප්‍රතික්‍රියාව ලියන්න.

8. (a) (i) ඒක-භාෂ්මික දුබල අම්ලයක ජලීය ද්‍රාවණයක සාන්ද්‍රණය (C) විඝටන ප්‍රමාණය ($\alpha$) සහ විඝටන නියතය ($K_a$) යන මේවා අතර ඇති සම්බන්ධය ව්‍යුත්පන්න කරන්න.
(ii) එක්තරා උෂ්ණත්වයකදී ඒක-භාස්මික දුබල අම්ලයක $0.01\ mol l^{-1}$ ජලීය ද්‍රාවණයක pH අගය 3.4 වේ. එම උෂ්ණත්වයේදී අම්ලයේ විඝටන නියතය ($K_a$) ගණනය කරන්න.
(b) (i) අණුවල චලිතය හා සම්බන්ධ 'බෝල්ට්ස්මාන් වක්‍රය' යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි රූප සටහනක් ආධාර කර ගනිමින් පැහැදිලි කරන්න.
(ii) උෂ්ණත්වය මඳ වශයෙන් වුවත් ඉහළ යන විට, රසායනික ප්‍රතික්‍රියාවක ශීඝ්‍රතාව සැලකිය යුතු වශයෙන් වැඩි වන්නේ මන්දැයි පහදා දෙන්න.
(c) (i) උත්ප්‍රේරකයක් යනු කුමක්ද?
(ii) උත්ප්‍රේරකවලට ලාක්ෂණික වන ගුණ තුනක් සඳහන් කරන්න.

"ඉ" කොටස - රචනා

9. (a) පොස්පරස් සහ ක්ලෝරීන් අතර ඇති රසායනික සමානකම් දෙකක් සහ රසායනික වෙනස්කම් දෙකක් සඳහන් කරන්න.
(b) පහත සඳහන් පරිවර්තන සිදු කළ හැකි ආකාරය දක්වන්න.
සැ. යු. අවශ්‍ය ප්‍රතික්‍රියා තත්ත්ව පැහැදිලිව උචිත ස්ථානවල සඳහන් කළ යුතුය. ප්‍රතික්‍රියා සඳහා තුලිත රසායනික සමීකරණ ලිවීම අවශ්‍ය නැත.
(i) $NH_3 \rightarrow N_2O_4$ (ii) $Mg(NO_3)_2 \rightarrow Mg_3N_2$
(c) පහත දැක්වෙන ප්‍රතික්‍රියා සඳහා තුලිත රසායනික සමීකරණ ලියන්න.
(1) $H_3BO_3 + HF$ (අධිකව)
(2) $CaH_2 + D_2O$ (අධිකව) සැ. යු. D = ඩියුටීරියම්
(3) $CuO + NH_3$ (වායුව)

10. (a) වීදුරු නිෂ්පාදනය පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක් ලියන්න.
(b) දියමන්ති විද්‍යුතය සන්නයනය නොකරයි. එහෙත්, මිනිරන් විද්‍යුතය සන්නයනය කරයි. මේ ද්‍රව්‍ය දෙකෙහි ව්‍යුහ පදනම කරමින් ඉහත වෙනස්කම ඔබට හැකි පමණ සම්පූර්ණ ලෙස පහදා දෙන්න.
(c) (i) එප්පාවල ඇපටයිට් නිදර්ශකයක්ද, $Ca_3(PO_4)_2$ නිදර්ශකයක්ද ඔබට සපයා තිබේ. රසායනික පරීක්ෂාවක් මගින් ඔබ මේ නිදර්ශක දෙක එකිනෙකින් වෙන් කර හඳුනා ගන්නේ කෙසේදැයි පැහැදිලි කරන්.
(ii) වී ගොවිතැන සඳහා පොස්පරස් ප්‍රභවයක් වශයෙන් එප්පාවල ඇපටයිට් කෙළින්ම භාවිතා කළ නොහැකි වන්නේ මන්දැයි පැහැදිලි කරන්න.
(d) වෙළෙඳ පොළෙහි ඇති කුරුඳු තෙල් නිදර්ශකයක් ඔබට සපයා තිබේ. මෙය සමඟ පොල් තෙල් මිශ්‍ර කර ඇති බවට සැකයක් ඇත. කුරුඳු තෙල් නිදර්ශකයෙහි ඇත්ත වශයෙන්ම පොල්තෙල් තිබෙන බව පෙන්වීම සඳහා රසායනික ක්‍රමයක් යෝජනා කරන්න.

11. (a) පරන්තන්හි භාවිත කල ක්‍රමය උපයෝගී කර ගනිමින් කෝස්ටික් සෝඩා නිපදවීම හා සම්බන්ධ වන භෞත රසායනික මූලධර්ම පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක් ලියන්න.
සැ. යු. වැදගත් අංශ හතරක් සලකා බැලීම ප්‍රමාණවත් වේ.
(b) කෝස්ටික් සෝඩා පහත සඳහන් ද්‍රව්‍ය සමඟ කවර තත්ත්ව යටතේ කෙසේ ප්‍රතික්‍රියා කරයිද?
(1) Sn (සැ. යු. මේ ප්‍රතික්‍රියාව සඳහා තුලිත රසායනික සමීකරණ ලිවිය යුතුය)
(2) නයිලෝන්
(c) සල්ෆියුරික් අම්ලය නිෂ්පාදනය කිරීමේ ස්පර්ශ ක්‍රමය හා සම්බන්ධ වන භෞත රසායනික මූලධර්ම පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක් ලියන්න.
සැ.යු. වැදගත් අංශ තුනක් සලකා බැලීම ප්‍රමාණවත් වේ.
(d) සල්ෆියුරික් අම්ලය පහත සඳහන් ද්‍රව්‍ය සමඟ කවර තත්ත්ව යටතේ කෙසේ ප්‍රතික්‍රියා කරයිද?
(i) කාබන්
සැ. යු. මේ ප්‍රතික්‍රියාව සඳහා තුලිත රසායනික සමීකරණය ලිවිය යුතුය.)
(ii) උක් සීනි.

12. (a) (i) පෙට්‍රෝලියම් ඉන්ධන සහ ගල් අඟුරු දහනය කිරීමෙන් වාතයට නිකුත් කෙරෙන පරිසර දූෂක හතරක් නම් කරන්න.
(ii) නූතන මහා පරිමාන කෘෂි කර්මාන්තයෙන් පරිසරය දූෂණය වන ආකාරය පැහැදිලි කරන්න.
(b) (i) ඔක්සිජන් හැරුණු විට, පෘථිවියෙහි පිට කබොල්ලෙහි සුලභ වන මූලද්‍රව්‍ය දෙක නම් කරන්න.
(ii) පාෂාණ ඛණිජ බවට පත්වීම හා සම්බන්ධයෙන් ඉතාම වැදගත් වන ද්‍රව්‍ය දෙක නම් කරන්න.
(c) (i) යකඩ නිෂ්පාදනය හා සම්බන්ධ වන මූලධර්ම සංක්ෂිප්තව දක්වන්න.
සැ. යු. අදල ප්‍රතික්‍රියා සඳහා තුලිත රසායනික සමීකරණ ලිවිය යුතුය.
(ii) ජලීය ද්‍රාවණයේ දී ෆෙරස් අයන හඳුනාගැනීම සඳහා රසායනික පරීක්ෂා දෙකක් දෙන්න.

## 1990 අගෝස්තු - රසායන විද්‍යාව

I කොටස

1. පරමාණුක ක්‍රමාංකය 41 වන M නැමැති මූල ද්‍රව්‍යයේ ඉහළම ඔක්සිකරණ තත්ත්වයෙන් ව්‍යුත්පන්න වන, ඔක්සයිඩයේ සූත්‍රය, මින් කුමක්ද?
(1) $M_2O_3$ වේ. (2) $MO_2$ වේ. (3) $M_2O_5$ වේ.
(4) $MO_3$ වේ. (5) $M_2O_7$ වේ.

2. X නමැති පරමාණුව ඇනායනයක් සාදයි. එම ඇනායනයෙහි අන්තිම උප ශක්ති මට්ටමේ තිබෙන ඉලෙක්ට්‍රෝන සංඛ්‍යාව
(1) 6 විය හැකිය. (2) 8 විය හැකිය. (3) 10 විය හැකිය.
(4) 16 විය හැකිය. (5) 18 විය හැකිය.

3. හයිඩ්‍රොකාබනයක් සම්පූර්ණයෙන් දහනය කිරීමෙන් කාබන් ඩයොක්සයිඩ් 0.66 g ද ජලය 0.36 g ද ලැබුණි. හයිඩ්‍රොකාබනයේ ආනුභවික සූත්‍රය
(1) $C_3H_{10}$ වේ. (2) $C_3H_4$ වේ. (3) $C_3H_8$ වේ.
(4) $C_6H_4$ වේ. (5) $C_6H_{12}$ වේ.

4. $0.10\ mol l^{-1}$ වන NaOH ද්‍රාවණයකින් 40 ml සහ $0.45\ mol l^{-1}$ වන $HNO_3$ ද්‍රාවණයකින් 10 ml ක් එකට මිශ්‍ර කරන ලදී. මෙයින් ලැබෙන ද්‍රාවණයේ pH අගය,
(1) 1 වේ. (2) 2 වේ. (3) 3 වේ. (4) 4 වේ. (5) 5 වේ.

5. රත් කරන ලද සින්ක් [illegible]

(1) Zn සහ $H_2O$ ලැබේ. (2) $Zn, N_2$ සහ $H_2O$ ලැබේ.
(3) $Zn_3N_2$ සහ $H_2O$ ලැබේ. (4) $Zn(OH)_2$ සහ $N_2$ ලැබේ.
(5) ඉහත සඳහන් කිසිම මිශ්‍රණයක් නොලැබේ.

6. මොනසයිට් හි
(1) Mg තිබේ. (2) Al තිබේ. (3) P තිබේ. (4) Cr [illegible]
(5) ඉහත සඳහන් කිසිවක් නැත.

7. $S_2O_3^{2-}$ ඇනායනයේදී සල්ෆර්හි ඔක්සිකරණ අංකය,
(1) +4 වේ. (2) +3 වේ. (3) +2 වේ. (4) +1 [illegible]
(5) ඉහත සඳහන් කිසිවක් නොවේ.

8. දුබලම අන්තර් අණුක ආකර්ෂණ දක්වන්නේ මින් කුමන අණුව [illegible]
(1) $NH_3$ (2) HI (3) $H_2S$ (4) $CH_4$ (5) $PH_3$

9. ඉලෙක්ට්‍රෝණයේ ආරෝපණය පරීක්ෂණාත්මකව ප්‍රමාණාත්මකව නිර්ණය කළේ,
(1) ක්රූක්ස්ය. (2) මිලිකන්ය (3) රදර්ෆඩ්ය.
(4) මෝස්ලිය. (5) පැරඩේය.

10.
$(CH_3)_3CCOOH$ (a), $CH_3CH(Br)COOH$ (b), $BrCH_2CH_2COOH$ (c), $FCH_2$[illegible] (d)

ඉහත දක්වා ඇති අම්ලවල ආම්ලික ප්‍රබලතාව මෙසේ ආරෝහණ [illegible]
(1) a<b<c<d, (2) a<c<b<d (3) a<d<c<b
(4) c<d<b<a (5) c<b<d<a

11. [illegible] නියමය ප්‍රකාශ කෙරේද?

www.sinhalalibrary.com

Find more: chemistrysabras.weebly.com
twitter: ChemistrySabras